# 13 රන්වන් කරල් කපන දා

පාන්දරින් අවදි වූ තාත්තා උගුර පාදන හඬ ඇසී මම ද අවදි වීමි. තාත්තා නැඟිට කුඹුරට යාමට සූදානම් වෙයි. මේ දිනවල දවසෙන් වැඩි කාලයක් තාත්තා කුඹුරේ ගත කරයි. ඔහු නිතර ම අම්මාත් සමග කුඹුර ගැන කතා කරයි.

"මෙදා සැරේ නම් අස්වැන්න සරුයි වගේ."

"ගොයම් පඳුරු ටික හොඳට හැදිලා තියෙනවා." තාත්තා අම්මාට කියයි.

තාත්තා තම කුඹුර ගැන අභිංසක ව සතුටු වෙයි.

"පොඩි මහත්තයාගේ අත්ගුණේ" යැයි අම්මා සිනහ මුසු මුහුණින් පවසයි.



අපේ කුඹුරු, ගමේ අනිත් අයගේ කුඹුරුවලට වඩා සරු බව ගමේ අය කියන කතා මගේ සිහියට නැඟිණි.

"හෙට ගොයම් කයියට වුවමනා කරන දේවල් ලෑස්ති කරලා ද තියෙන්නේ? තාත්තා අම්මාගෙන් අසයි.

"මම මේ පොළට යන්න කියලා තමයි ලෑස්ති වෙන්නේ."

අම්මා වියමින් සිටි පැදුර පසෙක තබමින් කීවා ය.

"බඩු මලු දෙකක්වත් ගෙනෙන්න වෙයි. කයියට දහදොළොස් දෙනෙක්වත් එයි නේ ද?"

"අර බටු ගෝනි දෙක පොළට ගෙනිහින් විකුණමු. නැතිනම් නරක් වෙලා විසිකරන්න වෙයි.

"ඒක හොඳයි" එහෙනම් අපි පොළට යමු.

ලොකු පුතාට කියන්න ලේල්වල මාමලාගේ ගෙදරට ගිහිල්ලා කොහොඹ ලෑල්ලයි. හක් ගෙඩියයි අරගෙන එන්න කියලා.

"පොඩි පුතේ, අයියාට තාත්තාගේ පණිවිඩය කියන්න."

"අම්මේ, දැන් පොළට යනවා ද? ඔව්.................. පොඩි පුතේ තැන් තැන්වල තියෙන බඩු එකතැනකට එකතු කරලා තියන්න."

එසේ කියා අම්මා පොළට ගියා ය.

පිච්ච වැල අසල සිටි අයියා "මම වෙල පැත්තෙන් ලේල්වල මාමලාගේ ගෙදර ගිහින් එන්නම්" කියා කීවේ ය.

මම තැන් තැන්වල තිබූ බඩු එකතැනකට එක් කළෙමි. හෙට කුඹුරට ගෙනයාමට අවශ්‍ය දේවල් පහසුවෙන් ගත හැකි පරිදි වෙන් කොට තැබුවෙමි.



පසු දින උදෑසන ම අපි සියලුදෙනා ම කුඹුරට ගියෙමු. තෙරුවන් වැඳ දෙවියන්ට පින් අනුමෝදන් කළෙමු. තාත්තා පැසුණු ගොයම් කරල් මිටක් අල්ලා දෑකැත්තෙන් කැපුවේ ය. ගොයම් කැපීමට පැමිණි අය ගොයම් කැපුවේ ඉන් පසුව ය. ඔවුහු එක පෙළට සිටගෙන ගොයමට නැමෙති. දකුණු අතින් දෑකැත්ත ගෙන ගොයම් කපති. කැපූ ගොයම් වම් අතින් ගෙන බිමින් තබති. ගොයම් ගස් නො පාගා ගොයම් කැපීමට ඔවුහු වගබලා ගනිති.

ඔවුහු ගොයම් කපන තෙක් අපි දුව පැන සෙල්ලම් කරන්නෙමු. කපා ඉතිරි වන ගොයම් ගසක සිදුර ඇති කොටසකින් නළා සාදන්නෙමු. කැපූ ගොයමෙන් නිකුත් වන සුවඳට නළා හඬ ද එකතු වූ විට සිතට සතුටක් දැනේ. තද අව්ව වුව ද අපේ සෙල්ලම් කිරීමට එය බාධාවක් නොවේ.

දහවල් වන විට අම්මා වැඩ කරන අයට ඇඹුල රැගෙන ආවා ය. ගොයම් කපමින් සිටි අය ඇලෙන් ඇඟපත සෝදාගෙන ගොඩට පැමිණියහ. ඔවුහු මයිල ගස් සෙවණේ වාඩි වූහ.

අම්මා ඔවුන්ට කෙසෙල් කොළවලට ආහාර බෙදා දුන්නා ය.

"අම්මේ, මේ බලන්න, මල්ලී බිම පෙරළෙනවා" කියා අක්කා කෑ ගැසුවා ය.

"පුතේ බිම දඟලන්න එපා. ඔය ගොයම් බට ඔයාගේ බඩේ ඇනෙයි. අත සෝදාගෙන ඇවිත් කෑම කන්න" කියා අම්මා මල්ලීගේ හිස අතගෑවා ය. කෙසෙල් කොළයට බෙදූ බත් මම ද ඉතා ආසාවෙන් කෑවෙමි. ගෙදර කන කෑමට වඩා මේ ඇඹුලේ අමුතු රසයක් ඇති බව මට දැනුණි.

## ක්‍රියාකාරකම : 1

පාඩමෙන් සුදුසු වචන ගෙන හිස්තැන් පුරවන්න.

1. ගොයම්.................................................... ටික හොඳට හැදිලා තියෙනවා.
2. අම්මා වියමින් සිටි .......................................... පසෙකින් තැබුවා ය.
3. ..................................................... මලු දෙකක්වත් ගෙනෙන්න වෙයි.
4. අර ............................................. ගෝනි දෙක පොළට ගෙනිහින් විකුණමු.
5. ලොකු පුතා .......................................... මාමලාගේ ගෙදරට යන්න.
6. කොහොඹ ................................................ හක්ගෙඩියයි අරගෙන එන්න.
7. අම්මේ ........................................ පොළට යනවා ද?
8. පොඩි පුතේ ..................................... තිබෙන බඩු එක තැනකට එකතු කරලා තියන්න.
9. අයියා පිච්ච ............................... අසල සිටියි.
10. "මම ............................ පැත්තෙන් ලේල්වල මාමලාගේ ගෙදර ගිහින් එන්නම්" කියා අයියා කීවේ ය.

## ක්‍රියාකාරකම : 2

පහත සඳහන් වචන නිවැරදි ව උච්චාරණය කරන්න.

i. පඳුර - පැදුර
ii. වෙල - වැල
iii. වැඩි - වෙඩි
iv. බට - බඩ
v. පෙළ - පැල

## ක්‍රියාකාරකම : 3

සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

i. හාවා .......................................... අස්සේ සැඟවුණේ ය.
( පතුර / පඳුර / පැදුර )

ii. අම්මා වියූ පන් .......................................... ඉතා අලංකාර ය.
(පැදුර / පඳුර /පතුර )

iii. ගොවියා කුඹුරේ .......................................... කරයි.
( වැඩ / මැඩ / වැට)

iv. මිනිසා .......................................... බඳියි.
( මැඩ / වැට / වැඩ )

## ක්‍රියාකාරකම : 4

පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. කඳු මුදුනින් ඇද හැලෙන දිය .................................... මනහර ය.
(ඇල්ල / අල්ල )

ii. ..................................... වවා මල්ලක් ගෙට ගනිමු. ( ඇල්ලක් / අල්ලක්)

iii. උදේ ආහාරය සඳහා කොළ ....................... බීම ගුණදායක ය.
(කැන්ද, කැඳ)

iv. ගැමියා එළවළු කොටුව වටා ..................................... බැන්දේ ය.
(වැට / වෙට)

v. අබලන් වූ වාහනය වෙනත් වාහනයක් යොදා .................................
ගෙන යන ලදී.( ඇද / අද )

vi. ළමයි පාසල් වත්තේ මල් ............................................... සිටුවති.
(පැළ / පෙළ )

vii. වැස්ස ................................................... නිසා ගඟ උතුරයි.
(වෙඩි / වැඩි )

viii. දඩයක්කරු සතුන්ට ............................................... තබයි.
(වෙඩි / වැඩි )

ix. පුහුල් ................................................ ගෙඩියක් හටගෙන තිබුණේ ය. (වැලේ/වෙලේ)

x. ගෙවිලිය ................................................ ඇඹුල රැගෙන ගියා ය. (වෙලට / වැලට)

## ක්‍රියාකාරකම : 5

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය නිවැරදි ව තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. අක්කා සමන් පිච්ච මල් ............... වතුර වත් කරයි.
අයියා ............... යයි. (වෙලට, වැලට)

ii. තාත්තා ............... බඳියි.
තාත්තා කුඹුරේ ............. කරයි. (වැඩ, වැට)

iii. ගොයම් ................. සරුවට වැඩී තිබේ.
නැන්දා වියූ පන් ................... අලංකාර ය. (පඳුර, පැදුර)

iv. ළමා ...................... ගස යට සිටිති.
මිනිසා පොල් අතු ......................... සාදයි. (පැල, පෙළ)

v. ළමයා ................. අව්වේ සෙල්ලම් කරයි.
ඔහු .............................. කට පිරිසිදු කරයි. (තද, දත)

vi. පියල් මේ ................ ගමට යයි.
සෙල්ලම් බඩු ................ තැන්වල දමා තිබේ. (තැන්, දැන්)

vii. මේ අඹ ගෙඩිය ..................
මුදල් දී පොත් ............................ (ගන්න, කන්න)

## ක්‍රියාකාරකම : 6

මෙවැනි ශබ්ද භේද ඇති වෙනත් වචන 10ක ලැයිස්තුවක් සකස් කරන්න. එම වචන යොදා අර්ථවත් වාක්‍ය 10ක් ලියන්න.